# පුරප්පාඩු
## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2025.01.15 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. <u>සේවා පැවරුම් පදනම මත පරිපාලක (යාන්ත්‍රික / විදුලි / ජලනල) (MEP Supervisor)</u>**

**සුදුසුකම් :**

I. පිළිගත් ආයතනයකින් ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු / විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් සමඟ මහල් ගොඩනැගිලි නඩත්තු කිරීම් සම්බන්ධ වසර පහක (05) පළපුරුද්ද.

**වැටුප :** රු. 100,000/- (දීමනා සමඟ) (වැටුප සාකච්ඡා කල හැකිය)

**සේවා පැවරුම් කාලසීමාව :** පළමුව වසරක සේවා පැවරුම් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ සේවා පැවරුම් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

**2. <u>කොන්ත්‍රාත් පදනම මත පරිපාලක (විදුලි)</u>**

**සුදුසුකම් :**

I. ජාතික තාක්ෂණ සහතිකය (විදුලි) හෝ සමාන සුදුසුකම් සමඟ වසර තුනක (03) සේවා පළපුරුද්ද (සේවා පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතිකය පාඨමාලාව හැදෑරීමේ කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

හෝ

II. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයන් හයක් සමත්වී තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පරිපාලකවරයෙකු වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් :** රු. 54,425/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස :** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## 3. <u>කොන්ත්‍රාත් පදනම මත තාක්ෂණික නිලධාරී</u>

**සුදුසුකම් :**

I. අ.පො.ස (උ/පෙළ) විද්‍යා විෂය ධාරාව යටතේ එක් වරකදී විෂයන් තුන (03) සමත් වී තිබිය යුතුය.

**සහ**

II. තනතුරට අදාල අවම වශයෙන් වසරක පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් සමත්ව තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම. (විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාව මත අදාළ පුහුණු පාඨමාලාව පිළිගැනීම සිදුකරනු ලබයි.)

**වැටුප් :** රු. 54,425/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## 4. <u>කොන්ත්‍රාත් පදනම මත පෙදෙරේරු</u>

**සුදුසුකම් :**

I. කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

II. පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

(අ) බිත්තිපාද, බිත්ති ආරුක්කු කේතුමය කණු, දුම් කවුළු කසළ කාණු කුහර ආදිය ඉදිකිරීමේදී උපයෝගී කර ගන්නා ගඩොල් වැඩ සහ නොයෙකුත් ආකාරයේ ක්‍රම.
(ආ) සියලුම අන්දමේ බදාමයන්, ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.
(ඇ) සැලසුම් කියවීම හා සරළ ඉදිකිරීම් සඳහා අත්තිවාරම දැමීම.
(ඇ) එමල්ෂන් තීන්ත පාවිච්චි කිරීම ඇතුළු තීන්ත ආලේප කිරීම.

III. පෙදෙරේරු වැඩ පිළිබඳව වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් :** රු. 52,715/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## 5. කොන්ත්‍රාත් පදනම මත රියදුරු

**සුදුසුකම් :**

I. අට ශ්‍රේණිය සමත් විය යුතුය.
II. බර වාහන පැදවීමේ දක්ෂතාවය පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතුය.
III. රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.
IV. ධාවන අළුත්වැඩියාවන් කර ගැනීමේ හැකියාව තිබිය යුතුය.
V. අවම වශයෙන් උස අඩි 05 අඟල් 2 ½ ක් විය යුතුය.
VI. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් ලබා තිබිය යුතුය.
VII. දිවා සහ රාත්‍රී සේවය සඳහා මනා ශාරීරික සෞඛ්‍යයෙන් සිටිය යුතු අතර ඇස් පෙනීමේ දුර්වලතාවයන් නොතිබිය යුතුය.

**වැටුප් :** රු. 52,715/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 6. කොන්ත්‍රාත් පදනම මත ආරක්ෂක නියාමක

**සුදුසුකම් :**

I. 8 ශ්‍රේණිය සමත් විය යුතුයි.

II. ක්‍රීඩා හා පොදු කටයුතු වලදී ක්‍රියාකාරී ලෙස දායක විය යුතුයි.

III. උස : අඩි 5යි අඟල් 4ට වඩා නොඅඩු විය යුතුයි.
පපුව : අඟල් 32ට වඩා නොඅඩු විය යුතුයි. (සාමාන්‍ය)

IV. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් :** රු. 49,825/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

**සටහන :** අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මඟින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ. එමෙන්ම සේවා අවශ්‍යතාවය මත සිදුකරනු ලබන අතිකාල සඳහා යම් සීමාවකට යටත්ව අතිකාල දීමනාවක් ගෙවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කල අයදුම්පත් **අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කළ පිටපත් ද සමඟ 2025.01.15 දින හෝ එදිනට** ප්‍රථම **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ. **කොන්ත්‍රාත් පදනම මත මෙම පත්වීම ලැබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ස්ථිර තනතුරක් ලැබීමට ද හිමිකම් නොලැබේ.**

**ලේඛකාධිකාරී,**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2025.01.01